සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය ( සැකසුම - ඩබ්. චන්ද්‍රිකා සමරසිංහ )

සැප්තැම්බර් මාසය - 4 සතිය සිරම්බි අඩිය - (සාරාංශකරණය)

1)සාරාංශකරණය යනු කුමක්දැ'යි අවබෝධ කර ගැනීමට මෙම ඡේදයෙහි හිස්තැන් පුරවන්න.

කිසියම් ප්‍රකාශනයක අන්තර්ගත ........... ම අදහස් ............... කොට දැක්වීම සාරාංශකරණයයි. යම් වාක්‍යයක ,ඡේදයක , දේශනයක ප්‍රකාශනයක .................. වටහා ගෙන එය සංක්ෂිප්ත ව ප්‍රකාශ කිරීම මෙහි දී සිදු වේ. ( කැටි, වැදගත්, හරය)

2) සාරාංශකරණයෙ දී අවධානය යොමු කළ යුතු කරුණු ලියන්න.

3) සාරාංශකරණයේ දී ඔබට තනි පදවලින් උපරිම ප්‍රයෝජන ගත හැකි ය. උපමා , පිරුළු , වාක්‍ය අලංකරණ යෙදුම් ආදිය ඉවත් කළ යුතු ය.

මෙම කරුණු ගැන අවධානය යොමු කරමින් පහත සඳහන් ඡේදය සාරාංශ කර ලියන්න.(ඡේදයෙහි වචන 30ක් ඇත.ඔබෙ සාරාංශයෙහි වචන 10ක් තිබිය යුතු ය.)

මම කියවීම සඳහා පොත්පත් තබා ඇති ස්ථානයට ගියෙමි. මම පුස්තකාලය භාර කරුණාබර, නිරහංකාර ගුරුතුමිය අසලට ගොස් කියවීම සඳහා පොතක් ඉල්ලා ගෙන මීයට පිම්බාක් මෙන් සිට පොත් කියවන යහළුවන් අතරට ඇදුනෙමි.

4)පහත සඳහන් වාක්‍යාංශ සාරාංශ කළ විට ලැබෙන වාක්‍ය කණ්ඩය හෝ වචනය සමඟ ගළපන්න.

| | |
|---|---|
| 1.මුතු ඇටයක් බඳු ශ්‍රී ලංකාව | පුරාතන යුගය |
| 2.තේ,රබර්,පොල් ,කරදමුංගු, කරාබුනැටි ආදිය | නංගී |
| 3.සද්ධර්මරත්නාවලිය,පූජාවලිය,අමාවතුර | සතර බ්‍රහ්ම විහරණ |
| 4.රෝස මලක් බඳු නංගි | අපනයන භෝග |
| 5.මෙත්තා ,කරුණා , මුදිතා , උපේක්ඛා | ශ්‍රී ලංකාව |

5) ඔබේ පෙළ පොතේ 144 පිටුවේ ඇති ඡේදය සාරාංශ කර ලියන්න.

6)"අපි ජාතික සමගිය සුරකිමු" මැයෙන් රචනයක් ලියන්න.